# (08) කෘෂි විද්‍යාව

## ප්‍රශ්න පත්‍ර ව්‍යුහය

I පත්‍රය :- **කාලය පැය 02යි.**
වරණ 5 බැගින් වූ බහුවරණ ප්‍රශ්න **50**කි. ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු **02** බැගින් මුළු ලකුණු **100**කි.

II පත්‍රය :- **කාලය පැය 03යි.** (ඊට අමතරව කියවීම් කාලය මිනිත්තු 10යි.)
මෙම ප්‍රශ්න පත්‍රය **ව්‍යුහගත රචනා හා රචනා** වශයෙන් කොටස් **දෙකකින්** සමන්විත වේ.

A කොටස - **ව්‍යුහගත රචනා** වර්ගයේ ප්‍රශ්න **හතරකි.** ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු **100** බැගින් ලකුණු **400**කි.

B කොටස - **රචනා** වර්ගයේ ප්‍රශ්න **හයකි.** ප්‍රශ්න **හතරකට** පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු **150** බැගින් ලකුණු **600**කි.

II පත්‍රය සඳහා මුළු ලකුණු = 1000 ÷ 10 = 100

**අවසාන ලකුණු ගණනය කිරීම** :-

| | | |
|---|---|---|
| I පත්‍රය | = | 100 |
| II පත්‍රය | = | 100 |
| අවසාන ලකුණු | = | 200 ÷ 2 = 100 |

**I පත්‍රය**

සැලකිය යුතුයි.

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න. (විභාගයේ දී පිළිතුරු සැපයීම සඳහා බහුවරණ කඩදාසියක් සපයනු ලැබේ.)

---

1. ශාකවල ආශ්‍රැති පීඩනය සහ පූටිකා චලන සඳහා අවශ්‍ය වන මූලද්‍රව්‍ය වන්නේ,
(1) N (2) P (3) K (4) Ca (5) Mg

2. නයිට්‍රජන් තිරකරමින් Poaceae කුලයේ ශාක සමග සහජීවනයෙන් ජීවත් වන බැක්ටීරියා කාණ්ඩය වන්නේ,
(1) *Azotobacter* (2) *Clostridium* (3) *Bacillus*
(4) *Rhizobium* (5) *Azospirillum*

3. මිටි ශාකයක උස වැඩිකර ගැනීමට යොදන හෝර්මෝනය වන්නේ,
(1) ගිබරලින් ය. (2) සයිටොකයිනින් ය. (3) ඔක්සින් ය.
(4) ඇබ්සිසික් අම්ලය ය. (5) එතිලින් ය.

4. පහත දැක්වෙන්නේ පටක රෝපණ විද්‍යාගාරවල භාවිත වන රසායනික ද්‍රව්‍ය සමහරකි.
A - ක්ලෝරොක්ස් ද්‍රාවණය B - එතනෝල්
C - ටීපෝල් D - ෆෝමලීන්
ඉහත රසායන ද්‍රව්‍ය අතුරින් පූර්වකයක මතුපිට ජීවානුහරණය සඳහා යොදා ගනු ලබන්නේ,
(1) A හා B පමණි. (2) A, B හා C පමණි. (3) A, B හා D පමණි.
(4) A, C හා D පමණි. (5) B, C හා D පමණි.

5. ලේයර් කිරීමේ දී මුල් ඇද්දවීමට බලපාන සාධකය/ සාධක වන්නේ,
(1) ශාක විශේෂයයි.
(2) අතුකැබැල්ලේ පරිණතභාවයයි.
(3) ශාක විශේෂය සහ අතුකැබැල්ලේ පරිණතභාවයයි.
(4) ශාක විශේෂය සහ අතුකැබැල්ලේ පොත්තේ ඝනකමයි.
(5) අතු කැබැල්ලේ පරිණතභාවය සහ පොත්තේ ඝනකමයි.

6. ස්වපරාගනය මගින් සමයුග්මක ශාක නිපදවා ගැනීමේ ක්‍රියාවලිය,
(1) දෙමුහුම් අභිජනනයයි. (2) සහාභිජනනයයි. (3) ක්ලෝනීකරණයයි.
(4) විකෘති අභිජනනයයි. (5) පෙළවැල අභිජනනයයි.

7. පසක ඇති ශාකයකට ලබා ගත හැකි ජල ප්‍රමාණය නිරූපණය වන්නේ,
(1) සංතෘප්ත ජල ප්‍රමාණය – ක්ෂේත්‍ර ධාරිතාවය මගිනි.
(2) සංතෘප්ත ජල ප්‍රමාණය – ස්ථිර මැලවීමේ අංකය මගිනි.
(3) ක්ෂේත්‍ර ධාරිතාවය – ස්ථිර මැලවීමේ අංකය මගිනි.
(4) සංතෘප්ත ජල ප්‍රමාණය – ජලාකර්ශක ජලය මගිනි.
(5) ක්ෂේත්‍ර ධාරිතාවය – ජලාකර්ශක ජලය මගිනි.

8. පසක ජලය රඳවා ගැනීමේ හැකියාව වැඩිවන්නේ,
(1) රළු බව වැඩිවීමත් සමඟ ය. (2) සියුම් බව වැඩිවීමත් සමඟ ය.
(3) සුසංහනය වැඩිවීමත් සමඟ ය. (4) අහඹු රළු බව වැඩිවීමත් සමඟ ය.
(5) සංස්ථිතිය වැඩි වීමත් සමඟ ය.

9. ශාක රෝග සහ රෝග ව්‍යාප්ත වන ආකාරවල සංයෝජන කිහිපයක් පහත වගුවේ දැක්වේ. රෝගය සහ එම රෝගය ව්‍යාප්ත වන ආකාරය නිවැරදි ව දැක්වෙන සංයෝජනය වන්නේ,

| | රෝගය | ව්‍යාප්ත වන ආකාරය |
|---|---|---|
| (1) | මුදු පුල්ලි රෝගය | ජලය |
| (2) | මැලවීම | වාහකයා |
| (3) | මලකඩ රෝගය | වාතය |
| (4) | මෘදු කුණු වීම | බීජ |
| (5) | පශ්චිම අංගමාරය | උපකරණ |

10. කෘමිනාශක බෝතලයක් ''ශාකමය සම්භවයක් සහිත කාබනික කෘමිනාශක'' යනුවෙන් ලේබල් කර තිබුණි. මෙම කෘමි නාශකයේ අඩංගු විය හැකි රසායනික ද්‍රව්‍ය වන්නේ,
(1) එන්ඩොසල්ෆාන් ය. (2) ඩයසිනොන් ය. (3) මීතැල්ඩිහයිඩ් ය.
(4) පයිරෙත්‍රම් ය. (5) කැප්ටාන් ය.

11. පහත දැක්වෙන්නේ ආහාර සංඝටක තුනක පෝෂක සංයුතිය වේ.
A - ප්‍රෝටීන 40%, තන්තු 10% සහ පිෂ්ඨය 40%
B - ප්‍රෝටීන 10%, තන්තු 40% සහ අළු 10%
C - ප්‍රෝටීන 41%, මේදය 30% සහ පිෂ්ඨය 10%
ඉහත ඒවා අතුරින්,
(1) A සහ C සමාන ශක්ති අගයයන් සහිත ප්‍රෝටීන පරිපූරක වේ.
(2) A සහ B තන්තුමය ආහාර වේ.
(3) B සහ C කුකුළන් පෝෂණය සඳහා යෝග්‍ය වේ.
(4) A සහ B ගවයන් පෝෂණය සඳහා යෝග්‍ය වේ.
(5) A සහ C කුකුළන් පෝෂණය සඳහා යෝග්‍ය වේ.

**12.** මානව පෝෂණය හා සම්බන්ධ පහත ප්‍රකාශ සලකා බලන්න.

A - ක්ෂුද්‍ර හා මහා පෝෂක දෙවර්ගයම අත්‍යාවශ්‍ය වේ.

B - විටමින, මහා පෝෂක ලෙස වර්ගීකරණය කරයි.

C - අත්‍යාවශ්‍ය මේද අම්ල, මිනිස් සිරුර තුළ අවශ්‍ය ප්‍රමාණවලින් සංස්ලේෂණය කරගත **නොහැක.**

D - ලිපිඩ යනු ක්ෂුද්‍ර පෝෂකයකි.

ඉහත ප්‍රකාශ අතුරින් සත්‍ය ප්‍රකාශ වන්නේ,

(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) B හා C පමණි. (4) B හා D පමණි. (5) C හා D පමණි.

**13.** විවිධාංගීකරණය කරන ලද සහ අගය එකතු කළ ආහාර සඳහා වඩාත් සුදුසු උදාහරණ වන්නේ අනුපිළිවෙළින්,

(1) රසකළ කළු තේ (Black tea) සහ බදින ලද සහල් පිටි ය.

(2) සහල් පිටි නූඩ්ල්ස් සහ පාන් ය.

(3) කුකුළු මස්වලින් පිසූ සොසේජස් සහ නොඉදුල් (virgin) පොල්තෙල් ය.

(4) යෝගට් සහ තක්කාලි සෝස් ය.

(5) ජීවාණුහරිත කිරි සහ අයිස්ක්‍රීම් ය.

**14.** පරිණත දර්ශක හා සම්බන්ධ පහත ප්‍රකාශ සලකා බලන්න.

A - අස්වනු නෙලීමේ නිවැරදි අවස්ථාව තීරණය කිරීම සඳහා පරිණත දර්ශක උපකාරී වේ.

B - සුදුසු පරිණත අවස්ථාවේ නෙලාගැනීමෙන් උපරිම අස්වැන්නක් ලැබේ.

C - pH අගය සහ පිෂ්ඨ කණිකාවල හැඩය මනා පරිණත දර්ශක වේ.

D - විශිෂ්ට ගුරුත්වය සහ මෘදු හෝ දැඩිබව මනා පරිණත දර්ශක වේ.

ඉහත ප්‍රකාශ අතුරින් සත්‍ය ප්‍රකාශ වන්නේ,

(1) A හා B පමණි. (2) B හා C පමණි. (3) A, B හා C පමණි.
(4) A, B හා D පමණි. (5) A, C හා D පමණි.

**15.** පාංශු සෞඛ්‍යය වැඩි දියුණු කළ හැකි වන්නේ,

(1) නොකඩවා අකාබනික පොහොර යෙදීමෙනි.

(2) පුරන් කාලයක් රහිත ව අඛණ්ඩව වගා කිරීමෙනි.

(3) නියත ගැඹුරකට නිරන්තරයෙන් සී සෑමෙනි.

(4) අඛණ්ඩව ඒක බෝග වගාවක් පවත්වා ගැනීමෙනි.

(5) ක්ෂේත්‍රයකින් අතිරික්ත ජලය ඉවත් කිරීමෙනි.

**16.** ''ජලගත වගාව'' වඩාත් හොඳින් පැහැදිලි කළ හැකි වන්නේ,

(1) ශාක පෝෂක අඩංගු මීදුම් පරිසරයක ශාක වගා කිරීම ලෙස ය.

(2) ශාක පෝෂක සහිත ජලීය මාධ්‍යයක ශාක වගා කිරීම ලෙස ය.

(3) පස් රහිත පෝෂක සහිත ඝන මාධ්‍යයක ශාක වගා කිරීම ලෙස ය.

(4) ඛනිජ රහිත ජලය සහිත මාධ්‍යයක ශාක වගා කිරීම ලෙසය.

(5) දියර පොහොර යොදා ගනිමින් ඕනෑම මාධ්‍යයක ශාක වගා කිරීම ලෙස ය.

**17.** පහත දැක්වෙන්නේ පලතුරු සඳහා යොදාගත හැකි අගනා අස්වනු නෙලීමේ සහ පසු අස්වනු ක්‍රමවේද සමහරකි.

A - උචිත Brix අගයක් භාවිතා කිරීම.

B - උණුසුම් ජලයේ ගිල්වීම

C - සවස් කාලයේ අස්වනු නෙලීම

ඉහත ක්‍රමවේද අතුරින් අඹවල පසු අස්වනු ගුණාත්මය පවත්වා ගැනීම සඳහා සුලභ ව භාවිතා කරන ක්‍රමවේදය/ක්‍රමවේද වන්නේ,

(1) A පමණි. (2) B පමණි. (3) A හා B පමණි. (4) A හා C පමණි. (5) B හා C පමණි.

**18.** ප්‍රාථමික බිම් සැකසීම හේතුවෙන් පසෙහි සිදුවිය හැකි වෙනස්කමක් වනුයේ,

(1) දෘශ්‍ය ඝනත්වය වැඩි වීම ය.
(2) සත්‍ය ඝනත්වය වැඩි වීම ය.
(3) පාංශු වාතනය වැඩි දියුණු වීම ය.
(4) අහඹු රළුබව අඩු වීම ය.
(5) පාංශු සච්ඡිද්‍රතාව අඩු වීම ය.

**19.** වියළි කලාපයේ ගොවියෙකු විසින් පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරන බව කෘෂිකර්මය හදාරණ ශිෂ්‍යයෙකු නිරීක්ෂණය කළේ ය.

A - එක් බෝගයක් වගා කිරීම
B - රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය ඔහු විසින් ම සිදු කිරීම
C - ගොවිතැන් කටයුතු දේශගුණික රටා අනුව සැලසුම් කිරීම

ඉහත ක්‍රියාකාරකම් අතරින් සම්ප්‍රදායික කෘෂිකාර්මික ක්‍රියාකාරකම/ක්‍රියාකාරකම් වනුයේ,

(1) A පමණි. (2) B පමණි. (3) C පමණි. (4) A හා B පමණි. (5) B හා C පමණි.

**20.** පහත දැක්වෙන්නේ සහල්වල ඉල්ලුම සහ සැපයුම කෙරෙහි බලපාන සාධක කිහිපයකි.

A - ශ්‍රම සඳහා පිරිවැය
B - නිෂ්පාදනයේ විකුණුම් මිල
C - පොහොර සහනාධාරය
D - පාරිභෝගිකයින්ගේ ආදායම

ඉහත සාධක අතරින්, සෘජුව ම වෙළෙඳපළ සැපයුම කෙරෙහි බලපාන සාධක වනුයේ,

(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) A හා D පමණි. (4) B හා C පමණි. (5) C හා D පමණි.

**21.** GPS තාක්ෂණය ප්‍රධාන වශයෙන් යොදා ගනු ලබන්නේ,

(1) සංරක්ෂණ ගොවිතැනේ දී ය.
(2) කාබනික ගොවිතැනේ දී ය.
(3) යථාතථ්‍ය ගොවිතැනේ දී ය.
(4) ජෛව ගතික ගොවිතැනේ දී ය.
(5) සමෝධානිත ගොවිතැනේ දී ය.

**22.** පහත දැක්වෙන්නේ වර්තමානයේ දී කෘෂිකර්ම ක්ෂේත්‍රය මුහුණ දෙනු ලබන ගැටලු කිහිපයකි.

A - කෘෂිකාර්මික ජෛව විවිධත්වය විනාශ වීම
B - ගොවි ජනගහනය අඩු වීම
C - ශාක, රෝග හා පළිබෝධවලට පාත්‍ර වීම

ඉහත ගැටලු අතරින් හරිත විප්ලවයේ **සෘණාත්මක** බලපෑම් සඳහා උදාහරණය/ උදාහරණ වන්නේ,

(1) A පමණි. (2) B පමණි. (3) C පමණි. (4) A හා B පමණි. (5) A හා C පමණි.

**23.** ගොවිපළ සතුන්ගේ සංක්‍රාමණික රෝගයක් පිළිබඳ ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

- සතුන්ගෙන් මිනිසාට සංක්‍රමණය වේ.
- ආසාදිත සතුන්ගේ නොපිසූ මස් හෝ පැස්ටරීකරණය නොකළ කිරි මගින් ආසාදනය වේ.
- රෝගකාරකය බැක්ටීරියාවකි.
- මාංශපේශිවල වේදනාව සහ අධික දහඩිය දැමීම ප්‍රධාන රෝග ලක්ෂණය වේ.

ඉහත රෝගය විය හැක්කේ,

(1) උමතු ගව රෝගය ය.
(2) මී උණ (ලෙප්ටොස්පයිරෝසිස්) ය.
(3) බෲසෙල්ලෝසිස් ය.
(4) කුරුළු උණ ය.
(5) සූකර උණ ය.

**24.** තෘණ සයිලේජ් නිෂ්පාදනයේ ප්‍රධාන පියවරයන්හි නිවැරදි අනුපිළිවෙළ වන්නේ, තෘණ ශාක කැපීම,

(1) සයිලෝව පිරවීම, එය වායුරෝධක කිරීම සහ තද කිරීම වේ.
(2) සයිලෝව පිරවීම, තද කිරීම සහ වැසීම වේ.
(3) මැලවීම, මිශ්‍ර කිරීම, සයිලෝව පිරවීම සහ වැසීම වේ.
(4) සයිලෝව පිරවීම, ජලය එකතු කිරීම, තද කිරීම සහ වැසීම වේ.
(5) ආමුකුලක සමඟ මිශ්‍ර කිරීම, සයිලෝව පිරවීම සහ වැසීම වේ.

**25.** එළකිරිවල මේද ප්‍රමාණය රඳාපවතින්නේ,
(1) ගව වර්ගය සහ ක්ෂීරණ අවධිය මත ය.
(2) ගව වර්ගය සහ කිරි දොවන ක්‍රමය මත ය.
(3) ක්ෂීරණ අවධිය සහ ආහාරයේ ඇති ඛනිජ ප්‍රමාණය මත ය.
(4) කිරි දොවන ක්‍රමය සහ ආහාරයේ ඇති ඛනිජ ප්‍රමාණය මත ය.
(5) ආහාරයේ ඇති ඛනිජ ප්‍රමාණය සහ වර්ගය මත ය.

**26.** වීවල අගය දාමයකට උදාහරණයක් වන්නේ,
(1) අස්වනු නෙලීම → එකතු කිරීම → තොග ගබඩා කිරීම → අලෙවිය
(2) අස්වනු නෙලීම → තොග ගබඩා කිරීම → එකතු කිරීම → ශ්‍රේණිගත කිරීම
(3) තොග ගබඩා කිරීම → ඇසිරීම → ශ්‍රේණිගත කිරීම → අලෙවිය
(4) තොග ගබඩා කිරීම → සැකසීම → ඇසිරීම → ශ්‍රේණිගත කිරීම
(5) අස්වනු නෙලීම → සැකසීම → එකතු කිරීම → අලෙවිය

- **27 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා පහත රූපසටහන භාවිතා කරන්න.**



1 square = 1 cm²

**27.** ඉහත රූප සටහනට අනුව පත්‍රයේ වර්ගඵලය වන්නේ,
(1) 6 $cm^2$ කි. (2) 8 $cm^2$ කි. (3) 14 $cm^2$ කි. (4) 26 $cm^2$ කි. (5) 36 $cm^2$ කි.

**28.** ජල ප්‍රභවයක සිට බිංදු ජල සම්පාදන පද්ධතියක ප්‍රධාන නලය දක්වා ජලය ගමන් කරන මාර්ගය වන්නේ,
(1) චූෂණ නලය, පෙරණ ඒකකය, පොම්පය සහ බෙදාහැරීමේ නලය යි.
(2) චූෂණ නලය, පොම්පය, බෙදාහැරීමේ නලය සහ පෙරණ ඒකකය යි.
(3) චූෂණ නලය, පොම්පය, පෙරණ ඒකකය සහ බෙදාහැරීමේ නලය යි.
(4) චූෂණ නලය, බෙදාහැරීමේ නලය, පොම්පය සහ පෙරණ ඒකකය යි.
(5) බෙදාහැරීමේ නලය, පොම්පය, චූෂණ නලය සහ පෙරණ ඒකකය යි.

**29.** පෝෂ තෘණ සහ පෝෂ රනිල සඳහා උදාහරණ වන්නේ පිළිවෙළින්,
(1) $CO_3$ සහ එරිත්‍රිනා ය.
(2) බ්‍රැකේරියා සහ එරිත්‍රිනා ය.
(3) $CO_3$ සහ පියුරේරියා ය.
(4) බ්‍රැකේරියා සහ පියුරේරියා ය.
(5) ගිණිතෘණ සහ සෙන්ට්‍රොසීමා ය.

**30.** කඩින් කඩ බෝග වගාවේ දී,
(1) පළමු බෝගයේ සහ දෙවන බෝගයේ ප්‍රජනක අවධි ක්ෂේත්‍රයේ එකම කාලයේ දී දක්නට ලැබේ.
(2) පළමු බෝගයේ සහ දෙවන බෝගයේ වර්ධක අවධි ක්ෂේත්‍රයේ එකම කාලයේ දී දක්නට ලැබේ.
(3) පළමු බෝගයේ වර්ධක අවධිය සහ දෙවන බෝගයේ ප්‍රජනක අවධිය ක්ෂේත්‍රයේ එකම කාලයේ දී දක්නට ලැබේ.
(4) පළමු බෝගයේ ප්‍රජනක අවධිය සහ දෙවන බෝගයේ වර්ධක අවධිය ක්ෂේත්‍රයේ එකම කාලයේ දී දක්නට ලැබේ.
(5) පළමු බෝගයේ අස්වනු නෙලූ පසු දෙවන බෝගය සිටවනු ලැබේ.

**31.** පරිසර උෂ්ණත්වය වැඩිවීමත් සමඟ,

(1) කිකිළියන් ඝන කවච සහිත බිත්තර දමයි.

(2) එළදෙනුන්ගේ කායික ක්‍රියාකාරකම් සහ හති දැමීම වැඩි වේ.

(3) සියලු ගොවිපළ සතුන් ජලය වැඩිපුර පානය කරයි.

(4) සියලු ගොවිපළ සතුන්ගේ දහඩිය දැමීම අරඹයි.

(5) සමහර ගොවිපළ සතුන්ගේ නිෂ්පාදනය අඩු වේ.

**32.** දඬු කැබලි මුල් අද්දවා ගැනීම සඳහා මීදුම් ප්‍රචාරක ප්‍රධාන වශයෙන් යොදා ගනී. මීදුම් ප්‍රචාරකයක ප්‍රශස්ත,

A - ආර්ද්‍රතාවයක් පවත්වා ගනී.

B - උෂ්ණත්වයක් පවත්වා ගනී.

C - පෝෂක මට්ටමක් පවත්වා ගනී.

ඉහත ප්‍රකාශ අතුරින් සත්‍ය ප්‍රකාශය/ප්‍රකාශ වන්නේ,

(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.

(4) A හා B පමණි. (5) A හා C පමණි.

**33.** රඹුටන් සඳහා වඩාත් සුදුසු වර්ධක ප්‍රචාරණ ක්‍රමවේදය වන්නේ,

(1) කුඤ්ඤ බද්ධය වේ. (2) පැලැස්තර බද්ධය වේ.

(3) වායව අතු බැඳීම වේ. (4) කඳ කැබලි වේ.

(5) මුල් කැබලි වේ.

- **34 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා පහත රූපසටහන භාවිතා කරන්න.**




**34.** ගොවිමහතෙකුට ඔහුගේ ගොවිපළේ විශාල භූමි ප්‍රමාණයක ඉහත රූපසටහනේ දක්වා ඇති අයුරින් පාත්ති සකස් කර ගැනීමට අවශ්‍යව තිබේ. මෙම කාර්යය සඳහා ඔහු විසින් භාවිතා කළයුතු උපකරණ වන්නේ පිළිවෙළින්,

(1) තැටි නඟුල, රිජරය, රොටොවේටරය වේ.

(2) රොටොවේටරය, උදැල්ල සහ රිජරය වේ.

(3) උදැල්ල, රේක්කය සහ උදළු මුල්ලුව වේ.

(4) තැටි නඟුල, කොකු නඟුල සහ රිජරය වේ.

(5) තැටි නඟුල, කොකු නඟුල, මෝල්බෝඩ් නඟුල වේ.

**35.** පහත දැක්වෙන්නේ සමහර රෝපණ මාධ්‍යවල ගතිලක්ෂණ කිහිපයකි.

A - මනා වාතනය B - මනා ජල වහනය

C - ඉහළ දෘශ්‍ය ඝනත්වය D - ඉහළ ජලය රඳවා ගැනීමේ හැකියාව

ඉහත ලක්ෂණ අතුරින් බඳුන් මිශ්‍රණයක් සඳහා සුදුසු ලක්ෂණ වන්නේ,

(1) A හා B පමණි. (2) A, B හා C පමණි. (3) A, B හා D පමණි.

(4) A, C හා D පමණි. (5) B, C හා D පමණි.

**36.** එක්තරා එළවළු බෝගයක මූලමණ්ඩල ගැඹුර 400 mm වේ. ලබාගත හැකි මුළු ජල ප්‍රමාණය වන 60 mmන් 50%ක් අඩු වීමෙන් පසු පසට ජල සම්පාදනය කරයි. ශුද්ධ ජල අවශ්‍යතාවය වන්නේ,

(1) 200 mm කි. (2) 120 mm කි. (3) 75 mm කි. (4) 60 mm කි. (5) 30 mm කි.

**37.** නිෂ්පාදන ක්‍රියාවලියක් හා සම්බන්ධ පහත දත්ත සලකා බලන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| යූරියා (කි.ග්‍රෑම්) | 1 | 2 | 3 | 4 | 5 |
| අස්වැන්න (කි.ග්‍රෑම්) | 20 | 50 | 90 | 140 | 180 |

යූරියා 4kgක් යොදා ගත් විට සාමාන්‍ය නිෂ්පාදනය සහ යූරියා භාවිතය 4kg සිට 5kg දක්වා වැඩිකළ විට ආන්තික නිෂ්පාදනය වන්නේ පිළිවෙළින්,

(1) 35 සහ 40 වේ. (2) 35 සහ 35 වේ. (3) 35 සහ 50 වේ.
(4) 40 සහ 35 වේ. (5) 40 සහ 50 වේ.

**38.** පහතරට සඳහා පොලිතින් උමගක් සැලසුම් කිරීමේ දී සලකනු ලබන ප්‍රධාන සාධකය වන්නේ,

(1) සාපේක්ෂ ආර්ද්‍රතාවය අඩු කිරීම ය. (2) උෂ්ණත්වය අඩු කිරීම ය.
(3) කෘමි හා පළිබෝධ හානි අඩු කිරීම ය. (4) රෝග අවස්ථා අඩු කිරීම ය.
(5) සුළඟේ බලපෑම අඩු කිරීම ය.

**39.** ශාක පෝෂකවල සක්‍රිය අවශෝෂණය පිළිබඳ ප්‍රකාශ දෙකක් පහත දැක්වේ.

A - සාන්ද්‍රණ අනුක්‍රමණයට එරෙහිව පෝෂක අවශෝෂණය කරගනී.
B - පෝෂක අවශෝෂණ ක්‍රියාවලියේ දී ශක්තිය (ATP) භාවිතා වේ.

ඉහත ප්‍රකාශ අතරින්,

(1) A සත්‍ය වන අතර, B අසත්‍ය වේ.
(2) A අසත්‍ය වන අතර, B සත්‍ය වේ.
(3) A සහ B ප්‍රකාශ දෙකම සත්‍ය වන අතර, A මගින් B පැහැදිලි කරයි.
(4) A සහ B ප්‍රකාශ දෙකම සත්‍ය වන අතර, B මගින් A පැහැදිලි කරයි.
(5) A සහ B ප්‍රකාශ දෙකම සත්‍ය වන අතර, B හා A අතර සම්බන්ධතාවයක් නොපවතී.

**40.** වල්පැළ පිළිබඳ ව නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) ගැඹුරු සීසෑම මගින් *Panicium repens* පාලනය කළ හැකි ය.
(2) සියලු වල්පැළ, කෘමීන් හා රෝග ඇති කරනු ලබන ජීවීන්ට විකල්ප ධාරකයින් ලෙස ක්‍රියා කරයි.
(3) කාලතරණ බීජ සහිත වල්පැළ පාලනය පහසු ය.
(4) ලිංගික හා අලිංගික ප්‍රචාරණ ක්‍රම දෙකම සහිත වල්පැළ මර්ධනය අසීරු ය.
(5) සියලු වල්පැළ ජලයෙන් යටකිරීමෙන් විනාශ කළ හැකි ය.

**41.** ජෛව පාලනය මගින් කෘමීන් පාලනය කිරීම පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - පරපෝෂී කෘමීන්ගේ සුහුඹුල් සහ කීට යන අවස්ථා දෙකම සෑමවිටම ජෛව පාලනයට ආයක වේ.
B - ධාරකයන් සොයා ගැනීම සඳහා පරපෝෂිතයන්ට මනා හැකියාවක් තිබිය යුතු ය.
C - විලෝපියකයන් ධාරක විශේෂී විය යුතු ය.
D - ව්‍යාධිජනකයින් මුඛය, උච්චර්මය සහ තුවාල හරහා පළිබෝධකයින්ගේ දේහයට ඇතුළු වේ.

ඉහත ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශ වන්නේ,

(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) B හා C පමණි.
(4) B හා D පමණි. (5) C හා D පමණි.

**42.** කුකුළු ගොවිපලක නිමැවුම් ප්‍රමාණය වැඩිවනවිට සාමාන්‍ය පිරිවැය අඩුවන බව නිරීක්ෂණය කරන ලදී. එවැනි තත්ත්වයක දී ආන්තික පිරිවැය,

(1) අඩු වේ.
(2) වැඩි වේ.
(3) වෙනස් වේ.
(4) සාමාන්‍ය පිරිවැයට වඩා පහළ අගයක් පවතී.
(5) සාමාන්‍ය පිරිවැයට වඩා ඉහළ අගයක් පවතී.

**43.** ගැඹුරු තෙලෙහි බදින ලද ආහාරයක් නරක් වීම කෙරෙහි උපරිම හා අවම වශයෙන් බලපෑ හැකි සාධක වන්නේ පිළිවෙළින්,

(1) ක්ෂුද්‍ර ජීවී ක්‍රියාවන් සහ භෞතික හානි වේ.
(2) ක්ෂුද්‍ර ජීවී ක්‍රියාවන් සහ ලයිපොලිටික් එන්සයිමීය ප්‍රතික්‍රියාව වේ.
(3) ලිපිඩ ඔක්සිකරණය සහ ක්ෂුද්‍ර ජීවී ක්‍රියාව වේ.
(4) ලිපිඩ ඔක්සිකරණය සහ එන්සයිමීය දුඹුරු වීමේ ප්‍රතික්‍රියාව වේ.
(5) එන්සයිමීය නොවන දුඹුරුවීමේ ප්‍රතික්‍රියාව සහ ලයිපොලිටික එන්සයිමීය ප්‍රතික්‍රියාව වේ.

**44.** ශිෂ්‍යයෙකු උදැසන කිරිදෙවුම් වාරයක ආරම්භයේ සහ අවසානයේ කිරි සාම්පල දෙකක් ලබාගෙන පිළිවෙළින් A සහ B ලෙස නම් කර, විශ්ලේෂණය කරන ලදී. එම සාම්පලවල වඩාත් හොඳින් සිදුකළ හැකි නිරීක්ෂණ වන්නේ,

(1) A සාම්පලයේ ලැක්ටෝස් ප්‍රමාණය B සාම්පලයේ ලැක්ටෝස් ප්‍රමාණයට වඩා ඉහළ වීම ය.
(2) B සාම්පලයේ ලැක්ටෝස් ප්‍රමාණය A සාම්පලයේ ලැක්ටෝස් ප්‍රමාණයට වඩා ඉහළ වීම ය.
(3) A සාම්පලයේ මේද ප්‍රමාණය B සාම්පලයේ මේද ප්‍රමාණයට වඩා ඉහළ වීම ය.
(4) B සාම්පලයේ මේද ප්‍රමාණය A සාම්පලයේ මේද ප්‍රමාණයට වඩා ඉහළ වීම ය.
(5) A සහ B සාම්පලවල මේද ප්‍රමාණය සහ ලැක්ටෝස් ප්‍රමාණය සමාන වීම ය.

**45.** තෙත් හා වියළි බල්බ උෂ්ණත්වමානයේ, තෙත් හා වියළි බල්බ පාඨාංකවල වෙනස ශුන්‍ය වන විට,

(1) ශාක මැලවීමට ලක්වේ.
(2) වාෂ්පීකරණ උත්ස්වේදනය ඉහළ නැංවේ.
(3) දිලීර රෝග ව්‍යාප්තිය වැඩිවේ.
(4) ශාක මැලවීමට ලක්වන අතර, දිලීර රෝග ව්‍යාප්තිය වැඩිවේ.
(5) වාෂ්පීකරණ උත්ස්වේදනය වැඩිවන අතර, දිලීර රෝග ව්‍යාප්තිය වැඩිවේ.

**46.** පහත දැක්වෙන සංයෝජන අතුරින්, කාලගුණික පරාමිතීන් සහ ශාක කෘත්‍යවල ඍජු සම්බන්ධතාවයක් දැක්වෙන සංයෝජනය වන්නේ,

(1) වර්ෂාපතනය සහ කඳ:මුල් අනුපාතය යි.
(2) ආලෝකයේ ගුණාත්මය සහ ප්‍රභා අවධි සංවේදීතාවය යි.
(3) ආලෝකය ලැබෙන කාලය සහ වසත්තීකරණය යි.
(4) සුළඟේ වේගය සහ වාෂ්පීකරණ උත්ස්වේදනය යි.
(5) ආලෝක තීව්‍රතාවය සහ මුල් වර්ධනය යි.

**47.** වාරි ඉංජිනේරුවරයෙකු විසින්, වාරි ජලසම්පාදන පද්ධතියක් නිර්මාණය කිරීමට යෝග්‍ය ජලප්‍රභවයක් තේරීම සඳහා යොදා ගත හැකි පහත සඳහන් සාධක වාර්තා කර තබාගන්නා ලදී.

A - ජල ප්‍රභවයක ජලමට්ටමේ ඍතුමය විචලතා

B - ජල ප්‍රභවයේ ඍතුමය ජල අස්වැන්න

ඉහත ජල ප්‍රභවය භාවිත කරමින් වාරිජල සම්පාදන පද්ධතියක් නිර්මාණය කිරීමේ දී,

(1) A පමණක් වැදගත් වේ.

(2) B පමණක් වැදගත් වේ.

(3) A සහ B ප්‍රකාශ දෙකම වැදගත් වේ.

(4) A සහ B ප්‍රකාශ දෙකම වැදගත් වන අතර, A, B මත රඳා පවතී.

(5) A සහ B ප්‍රකාශ දෙකම වැදගත් වන අතර, B, A මත රඳා පවතී.

**48.** ප්‍රාථමික බිම් සැකසීම පිළිබඳ ප්‍රකාශ දෙකක් පහත දැක්වේ.

A - සුසංහිත පස් නිරාවරණය හෝ පෙරලීම සිදු කරයි.

B - වල්පැළ සහ ඉපනැල්ල ඉවත් කර පස සමතලා කරයි.

ඉහත ප්‍රකාශ අතරින්,

(1) A සත්‍ය වන අතර, B අසත්‍ය වේ.

(2) A අසත්‍ය වන අතර, B සත්‍ය වේ.

(3) A සහ B ප්‍රකාශ දෙකම සත්‍ය වේ.

(4) A සහ B ප්‍රකාශ දෙකම අසත්‍ය වේ.

(5) A සහ B ප්‍රකාශ සත්‍ය වන අතර, B මගින් A තවදුරටත් පැහැදිලි කරයි.

**49.** පාංශු පැතිකඩක් පිළිබඳ ප්‍රකාශ දෙකක් පහත දැක්වේ.

A - පාංශු පැතිකඩක් අධ්‍යයනය කිරීම මගින් පාංශු කලාප තුළ සිදුවන සංචායනය (eluviation) සහ විශෝධනය (illuviation) යන ක්‍රියාවලීන් හඳුනා ගත හැකි ය.

B - සංචායන ක්‍රියාවලිය නිසා වැඩි ඛනිජ ප්‍රමාණයක් "A" කලාපය තුළ රඳවා ගැනේ.

ඉහත ප්‍රකාශ අතරින්,

(1) A සත්‍ය වන අතර, B අසත්‍ය වේ.

(2) B සත්‍ය වන අතර, A අසත්‍ය වේ.

(3) A සහ B ප්‍රකාශ දෙකම සත්‍ය වේ.

(4) A සත්‍ය වන අතර, B මගින් A තවදුරටත් පැහැදිලි කරයි.

(5) B සත්‍ය වන අතර, A මගින් B තවදුරටත් පැහැදිලි කරයි.

- **50 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා පහත දැක්වෙන ප්‍රකාශය සහ හේතුව යොදා ගන්න.**

**ප්‍රකාශය** :- සමෝධානිත ගොවිතැන තිරසර ගොවිතැන් පද්ධතියකි.

**හේතුව** :- ඒ ප්‍රධාන වශයෙන් ම අඩු ශ්‍රම අවශ්‍යතාවය නිසා ය.

**50.** ඉහත ප්‍රකාශය හා හේතුව අතුරින්,

(1) ප්‍රකාශය හා හේතුව දෙකම නිවැරදි අතර, ප්‍රකාශය, හේතුව මගින් තවදුරටත් පැහැදිලි කරයි.

(2) ප්‍රකාශය හා හේතුව දෙකම නිවැරදි අතර, හේතුව මගින් ප්‍රකාශය පැහැදිලි නොකරයි.

(3) ප්‍රකාශය සත්‍ය නමුත් හේතුව නිවැරදි නොවේ.

(4) ප්‍රකාශය සාවද්‍ය නමුත් හේතුව නිවැරදි ව දැක්වේ.

(5) ප්‍රකාශය හා හේතුව දෙකම සාවද්‍ය වේ.

* * *

# (08) කෘෂි විද්‍යාව

## II පත්‍රය

සැලකිය යුතුයි.

* A කොටසේ ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු සපයන්න.
* B කොටසෙන් ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

---

## A කොටස - ව්‍යුහගත රචනා

**1.** **(A)** විවිධ කාලගුණික දත්ත ලබා ගැනීම සඳහා තෙත් හා වියළි බල්බ උෂ්ණත්වමානය හා උපරිම හා අවම උෂ්ණත්වමානය ස්ටීවන්සන් ආවරණය තුළ තැන්පත් කරනු ලැබේ.

**(i)** ඉහත උපකරණ ස්ටීවන්සන් ආවරණය තුළ තැන්පත් කිරීමට හේතුවක් සඳහන් කරන්න.

.......................................................................................................................................

**(ලකුණු 04යි)**

**(ii)** වියළි බල්බ උෂ්ණත්වමාන පාඨාංකයට සාපේක්ෂව තෙත් බල්බ උෂ්ණත්වමාන පාඨාංකය අඩු අගයක් ගැනීමට හේතුව සඳහන් කරන්න.

.......................................................................................................................................

**(ලකුණු 04යි)**

**(iii)** සිසුවකු විසින් පාඨාංක ලබා ගැනීමේ දී තෙත් හා වියළි බල්බ උෂ්ණත්වමාන පාඨාංක අගයයන් සමාන බව නිරීක්ෂණය කරන ලදී. එම දෝෂයට හේතුවක් හා එයට විසඳුමක් සඳහන් කරන්න.

**දෝෂයට හේතුව** **දෝෂය නිවැරදි කිරීම**

.................................................... **(ලකුණු 02යි)** .................................................... **(ලකුණු 02යි)**

**(iv)** පාඨාංක ලබා ගැනීමෙන් පසු උපරිම හා අවම උෂ්ණත්වමානයක් නැවත සකසන අයුරු සඳහන් කරන්න.

.......................................................................................................................................

**(ලකුණු 04යි)**

**(B)** බෝගවගා ක්ෂේත්‍රවල ඉහළ කෘෂිකාර්මික ඵලදායිතාවයක් පවත්වා ගැනීම සඳහා පස තිරසරව කළමනාකරණය කිරීම වැදගත් වේ.

**(i)** පාංශු නිෂ්පාදකතාව සම්බන්ධයෙන් පාංශු පැතිකඩක A කලාපයේ වැදගත්කම සඳහන් කරන්න.

.......................................................................................................................................

**(ලකුණු 04යි)**

**(ii)** පාංශු වර්ණය මගින් නිගමනය කළ හැකි වැදගත් තොරතුරු **දෙකක්** දක්වන්න.

(1) ........................................................................................................................ **(ලකුණු 02යි)**

(2) ........................................................................................................................ **(ලකුණු 02යි)**

**(iii)** හායනය වූ උස්බිම් පසක දක්නට ලැබෙන ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.

(1) ........................................................................................................................ **(ලකුණු 02යි)**

(2) ........................................................................................................................ **(ලකුණු 02යි)**

**(C)** ද්‍රවමාන ක්‍රමයෙන් පාංශු වයනය නිර්ණය කිරීමේ දී සිසුවකු පහත පාඨාංක ලබා ගන්නා ලදී.

- පස් නියැදියේ තෙත ස්කන්ධය - 50 g
- තෙතමන සාධකය - 1.004
- මිනිත්තු දෙකක දී පාංශු ද්‍රාවණයේ සංශෝධිත ද්‍රවමාන පාඨාංකය - 12.43
- මිනිත්තු දෙකක දී පාලක පරීක්ෂණයේ සංශෝධිත ද්‍රවමාන පාඨාංකය - 2.00

**(i)** පස් නියැදියේ වියළි ස්කන්ධය ගණනය කරන්න.

.......................................................................................................................................

....................................................................................................................................... **(ලකුණු 04යි)**

**(ii)** මැටි හා රොන්මඩ ප්‍රතිශතය ගණනය කරන්න.

.......................................................................................................................................

....................................................................................................................................... **(ලකුණු 04යි)**

**(iii)** වැලි ප්‍රතිශතය ගණනය කරන්න.

.......................................................................................................................................

....................................................................................................................................... **(ලකුණු 04යි)**

**(iv)** රොන්මඩ ප්‍රතිශතය 8.9%ක් නම් මැටි ප්‍රතිශතය ගණනය කරන්න.

.......................................................................................................................................

....................................................................................................................................... **(ලකුණු 04යි)**

**(v)** දී ඇති වයන ත්‍රිකෝණය භාවිතයෙන් පස් නියැදියට අදාළ වයන පංති කාණ්ඩය සඳහන් කරන්න.




....................................................................................................................................... **(ලකුණු 04යි)**

**(D)** ධීවර හා පශු සම්පත් ක්ෂේත්‍ර සංවර්ධනයේ දී වැදගත් වන රාජ්‍ය ආයතන **තුනක්** සඳහන් කරන්න.

(1) ....................................................................................................................................... **(ලකුණු 04යි)**

(2) ....................................................................................................................................... **(ලකුණු 04යි)**

(3) ....................................................................................................................................... **(ලකුණු 04යි)**

**(E)** ශාක වර්ධනයට අවශ්‍ය මූලද්‍රව්‍ය ශාකපෝෂක ලෙස හඳුන්වයි.

**(i)** යම් මූලද්‍රව්‍යයක් අත්‍යවශ්‍ය මූලද්‍රව්‍යයක් ලෙස සැලකීමට යොදා ගන්නා ගුණාංග **තුනක්** සඳහන් කරන්න.

(1) ........................................................................................................ **(ලකුණු 02යි)**

(2) ........................................................................................................ **(ලකුණු 02යි)**

(3) ........................................................................................................ **(ලකුණු 02යි)**

**(ii)** මූලද්‍රව්‍යයක් සචල මූලද්‍රව්‍යයක් ලෙස සැලකීමට හේතුව සඳහන් කරන්න.

.................................................................................................................. **(ලකුණු 02යි)**

**(iii)** පහත සඳහන් අත්‍යවශ්‍ය මූලද්‍රව්‍යවල කාර්යයක් බැගින් සඳහන් කරන්න.

| **මූලද්‍රව්‍යය** | **කාර්යය** | |
|---|---|---|
| (1) පොස්පරස් | ............................................................... | **(ලකුණු 04යි)** |
| (2) පොටෑසියම් | ............................................................... | **(ලකුණු 04යි)** |

**(iv)** පහත සඳහන් එක් එක් ශාක පෝෂක ඌනතාවය නිවැරදි කිරීමට යෙදිය යුතු රසායනික පොහොර වර්ගයක් බැගින් සඳහන් කරන්න.

(1) ධාන්‍ය බෝගවල පත්‍ර දම් පැහැවීම ............................................................ **(ලකුණු 02යි)**

(2) පරිණත පත්‍ර කහ පැහැති වීම සහ විකෘති වූ මල් හා ඵල හට ගැනීම ............................................................ **(ලකුණු 02යි)**

(3) පත්‍ර දාර කහ පැහැති පිළිස්සුණු ස්වභාවයක් ගැනීම ............................................................ **(ලකුණු 02යි)**

(4) අග්‍රස්ථ ඇඹරී විකෘති වීම ............................................................ **(ලකුණු 02යි)**

**(F)** කෘෂිකර්මාන්තයේ දී ඉහළ ගුණාත්මයෙන් යුතු රෝපණ ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා තවාන් ශිල්ප ක්‍රම වැදගත් වේ.




***P*** ***Q***

**(i)** ඉහත "***P***" සහ "***Q***" රූපසටහන් මගින් දැක්වෙන තවාන් වර්ග දෙක නම් කරන්න.

(1) ***P*** - ........................................................................................ **(ලකුණු 02යි)**

(2) ***Q*** - ........................................................................................ **(ලකුණු 02යි)**

**(ii)** "*P*" හි රෝපණ මාධ්‍ය ලෙස යොදා ගන්නා ද්‍රව්‍ය **දෙකක්** නම් කරන්න.

(1) .................................................................................................................... **(ලකුණු 02යි)**

(2) .................................................................................................................... **(ලකුණු 02යි)**

**(iii)** තවාන් පාත්තිවල තවාන් දැමීමට නුසුදුසු, එහෙත් "*P*" තවානේ තවාන් දැමීමට සුදුසු බෝග බීජ වර්ග **දෙකක්** නම් කරන්න.

(1) .................................................................................................................... **(ලකුණු 02යි)**

(2) .................................................................................................................... **(ලකුණු 02යි)**

**(iv)** ඉහත සඳහන් කළ බෝග බීජ තවාන් පාත්ති සඳහා යෙදීම සුදුසු නොවීමට හේතුවක් සඳහන් කරන්න.

....................................................................................................................

....................................................................................................................

....................................................................................................................

....................................................................................................................

.................................................................................................................... **(ලකුණු 02යි)**

**(v)** "*Q*" තවානේ දී භාවිත කරන පෝෂණ ද්‍රාවණය නම් කරන්න.

.................................................................................................................... **(ලකුණු 02යි)**

**2. (A)** ශාක ප්‍රචාරණය බහුලව සිදු කරන ක්‍රමයක් පහත රූපසටහනේ දැක්වේ.



**(i)** ඉහත ප්‍රචාරණ ක්‍රමය නම් කරන්න.

.................................................................................................................... **(ලකුණු 02යි)**

**(ii)** ඉහත ප්‍රචාරණ ක්‍රමය මගින් බහුලව ප්‍රචාරණය කරන පලතුරු ශාක **දෙකක්** නම් කරන්න.

(1) ..............................................................................................................,,,...... **(ලකුණු 02යි)**

(2) ..............................................................................................................,,,.... **(ලකුණු 02යි)**

**(iii)** ඉහත ප්‍රචාරණ ක්‍රමයේ දී මුල් ඇදීමට හේතුවන කායික විද්‍යාත්මක ක්‍රියාවලිය සඳහන් කරන්න.

....................................................................................................................

....................................................................................................................

.................................................................................................................... **(ලකුණු 04යි)**

**(iv)** අනෙකුත් වර්ධක ප්‍රචාරණ ක්‍රම හා සැසඳීමේ දී ඉහත වර්ධක ප්‍රචාරණ ක්‍රමයේ වාසි **දෙකක්** දක්වන්න.

(1) .................................................................................................................... **(ලකුණු 04යි)**

(2) .................................................................................................................... **(ලකුණු 04යි)**

**(B)** බෝග ප්‍රචාරණය සඳහා විවිධ වර්ධක ප්‍රචාරණ ක්‍රම භාවිත වේ.

**(i)** පහත දැක්වෙන බෝග සඳහා වඩාත් සුදුසු වර්ධක ප්‍රචාරණ ක්‍රමය බැගින් දක්වන්න.

(1) රෝස ........................................................................................ **(ලකුණු 02යි)**

